අක්මීමන කපුහෙම්පළ නිවසක සාලයේ නිදාසිටි අයෙකු, නිවසට ඇතුළු වූ නාඳුනන පුද්ගලයෙකු විසින් ඝාතනය කිරීමේ පුවත, දිනමිණ පුවත්පත (ජූනි 14, 2023) දින වාර්තා කර තිබිණි. කෙසේ නමුත්, එම ඝාතනයට ලක්වූ පුද්ගලයාගේ මළසිරුරේ ඡායාරූපයක් ද එම පුවත සමඟ පළ කර තිබිණි.

මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව, ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට මාධ්‍ය ප්‍රවේසම් සහගත විය යුතු වේ.

මන්ද යත්, මාධ්‍ය ඔස්සේ පළ වන, කෙනෙකුට නැරඹීමට අපහසු තරමේ ලේ වැකි, සංවේදී ඡායාරූප හෝ දර්ශන ඇතැම් පුද්ගලයින් හට නැරඹීමට නොහැකි වීමත්, එවැනි අන්තර්ගතයන් ඒ ඔස්සේ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය වීමට ඇති හැකියාවත් හේතුවෙනි.

ඒ අනුව,

1) ඇතැම් පාඨකයෙකුට නැරඹීමට අපහසු විය හැකි ආකාරයේ මෙවැනි ලේ වැකි, සංවේදී දසුන්, අඩු තරමින් කිසිදු බොඳ කිරීමකින් පවා තොරව මෙසේ පළ කිරීම අත්‍යවශ්‍ය වේ යැයි ඔබ සිතන්නේ ද?

2) මෙම සංවේදී අන්තර්ගතයන් රහිතව පුවත පළ කිරීමේදී, පුවතේ අන්තර්ගතයට හෝ බරපතළ භාවයට හානියක් සිදුවේ යැයි ඔබ සිතන්නේද?

3) මෙවැනි සංවේදී ඡායාරූපයන් පළ කිරීම මගින්, මෙම පුවත් වාර්තාවන් ඔස්සේ ඉදිරිපත් වන සමස්ත චිත්‍රයට දායකත්වයක් ලැබෙන්නේ යැයි ඔබ සිතන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!